# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## බාහිර විභාග අංශය

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ද්විතීය පරීක්ෂණය (බාහිර) - 2010**
**2012 ජනවාරි / පෙබරවාරි**

**මානවශාස්ත්‍ර පීඨය**

**නාට්‍ය හා රංග කලාව - DMAT E2025**

**පෙරදිග ගැමි නාටක හා සම්භාව්‍ය රංග සම්ප්‍රදා**

**<u>ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.</u>**

**ප්‍රශ්න සංඛ්‍යාව : 09 යි.** **කාලය : පැය 03 යි.**

---

01. ඉන්දියානු ගැමි නාටක ප්‍රභේද වර්ගීකරණය කොට ඒවායේ විද්‍යමාන විශේෂ ලක්ෂණ පිළිබඳ විමසීමක් කරන්න.

02. උතුරු හා දකුණු ඉන්දීය ගැමි නාටකවල අන්තර්ගත කතා පුවත් කෙරෙහි හින්දු ආගමික සහ වීර කාව්‍ය සාහිත්‍යයේ බලපෑම විමසුමට ලක්කරන්න.

03. සංස්කෘත නාට්‍යයේ ප්‍රභවය පිළිබඳව ඉදිරිපත්ව ඇති මතවාද පරීක්ෂා කරන්න.

04. ශුද්‍රක විසින් රචිත මෘච්ඡකටිකාවෙහි චරිත නිරූපණය පිළිබඳ විවරණයක් කරන්න.

05. නෝ සම්භාව්‍ය නාට්‍ය කලාවක් බවට පත් කිරීමට කන්අමි හා සෙඅමි මොතොකියොගෙන් ඉටු වූ මෙහෙවර විමසන්න.

06. අමිතාභ බුදුදහමේ හා ශෙන් බුදුදහමේ අදහස් හා සංකල්ප නිරූපණය කිරීමට නෝ නාට්‍ය මගින් උත්සාහගෙන ඇති අයුරු <u>'සුමිද නදිය'</u> හෝ <u>'දෝජෝ විහාරය'</u> නාට්‍ය ඇසුරෙන් සාකච්ඡා කරන්න.

07. නෝ වේදිකාව සහ එහි රංග ශෛලිය පිළිබඳ විවරණයක් කරන්න.

08. කබුකි නාට්‍ය කලාවේ විශේෂ ලක්ෂණ කෙටියෙන් හඳුන්වා දී කබුකි නළුවාගේ රංග කාර්යය විමර්ශනය කරන්න.

09. නළු කලාවක් ලෙස ප්‍රකට පීකිං ඔපෙරාවේ රූපණයෙහි දක්නට ලැබෙන විශේෂතා විමර්ශනය කරන්න.

**********************************